අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු

# General Certificate of Education (Adv. Level) Examination, August 2014

සාමාන්‍ය පොදු පරීක්ෂණය / පැය දෙකයි මිනිත්තු තිහයි.

## Common General Test / Two hours and thirty minutes.

- උපදෙස් :

  ✲ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  ✲ ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

  ✲ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.

  ✲ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.

  ✲ 01 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.

01. අපගේ ක්‍රිකට් ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රී ලංකාව එංගලන්තයේ දී එංගලන්තයට එරෙහි ව ටෙස්ට් තරගාවලියක් ජය ගත්තේ ය. එම ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වූයේ,

(1) කුමාර් සංගක්කාර ය. (2) ඇන්ජලෝ මැතිව්ස් ය. (3) මහේල ජයවර්ධන ය.
(4) ලසිත් මාලිංග ය. (5) දිනේෂ් චන්දිමාල් ය.

(2)

02. ශ්‍රී ලංකාවේ වළක්වා ගත හැකි මරණවලට ප්‍රධාන හේතුව දුම්කොළ භාවිතය බව වෛද්‍යවරු ප්‍රකාශ කරති. ඒ අනුව ඔවුන්ගේ තක්සේරුව මත දිනකට සිදු වන මරණ සංඛ්‍යාව :

(1) 10 ට අඩු ය. (2) 20 සහ 30 අතර වේ. (3) 50 ක් පමණ ය.
(4) 60 සහ 70 අතර වේ. (5) 80 ට වැඩි ය.

(3)

03. සිගරට් පැකට්ටුවක බාහිර මතුපිට 80% ක් රූපමය සෞඛ්‍ය අනතුරු ඇඟවීම්වලින් යුක්ත විය යුතු බව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ඒකමතික ව තීරණය කරන ලදි. දුම්කොළ කර්මාන්තය අධිකරණය මාර්ගයෙන් මෙම ප්‍රමාණය අඩු කර ගත්තේ,

(1) 75% දක්වා ය. (2) 60% දක්වා ය. (3) 55% දක්වා ය.
(4) 50% දක්වා ය. (5) 40% දක්වා ය.

(2)

04. මදුරුවන් මගින් බෝ වන රෝගයක් **නොවන්නේ**, පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) මැලේරියා (2) චිකුන්ගුන්යා (3) ඒඩ්ස්
(4) බරවා රෝගය (5) ඩෙංගු

(3)

05. නරේන්ද්‍ර මෝදි ඉන්දියාවේ අගමැති ලෙස පත් වූයේ 2014 මැයි මාසයේ දී ය. ඔහු පිළිබඳ ව පහත සඳහන් ප්‍රකාශ අතරින් **අසත්‍ය** ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) ඔහු භාරතීය ජනතා පක්ෂයේ සාමාජිකයෙකි.
(2) ඔහු තේ විකුණන්නකුගේ පුතෙකි.
(3) ඔහු ගුජරාටයෙහි ප්‍රධාන අමාත්‍යවරයා ව සිටියේ ය.
(4) ඔහු අවිවාහක ය.
(5) ඔහුගේ රජයට පාර්ලිමේන්තුවේ පැහැදිලි බහුතරයක් හිමි ව ඇත.

(4)

06. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරයේ උපරිම කාල සීමාව එක් වරකට,

(1) අවුරුදු 3 කි. (2) අවුරුදු 4 කි. (3) අවුරුදු 5 කි.
(4) අවුරුදු 6 කි. (5) අවුරුදු 12 කි.

(4)

07. ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකමක් **නොවන්නේ**, පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) නීතිය ඉදිරියේ සමානතාව (2) සමාජීය සමිතිවලට බැඳීමේ අයිතිය
(3) පෞද්ගලික දේපළ හිමිකර ගැනීමේ අයිතිය (4) ඕනෑ ම ආගමක් ඇදහීමේ නිදහස
(5) නිදහස් සෞඛ්‍ය සේවයක් ලැබීමේ අයිතිය

(5)

08. 'අරාබි වසන්තය' නම් වූ දේශපාලන ක්‍රියාවලියේ බලපෑමට හසු නොවූයේ, පහත සඳහන් රටවල් අතරින් කිනම් රට ද?
(1) සවුදි අරාබිය (2) ලිබියාව (3) සිරියාව
(4) ඊජිප්තුව (5) යේමනය

(1)

09. එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ජන්ම ශත සංවත්සරය 2014 ජුනි 03 දිනට යෙදී තිබිණ. පහත සඳහන් විවිධ ක්ෂේත්‍ර අතරින් ඔහු උපරිම දායකත්වයක් සැපයුවේ,
(1) සංගීතයට යි. (2) නාට්‍යයට යි. (3) සාහිත්‍යයට යි.
(4) දර්ශනයට යි. (5) සිනමාවට යි.

(2)

10. පහත සඳහන් යුගල අතරින් **නොගැළපෙන** ලෙස සම්බන්ධ වී ඇත්තේ කිනම් යුගලය ද?
(1) අයින්ස්ටයින් - භෞතික විද්‍යාව (2) ලියනාඩෝ ඩාවින්චි - චිත්‍ර ඇඳීම
(3) ලෙස්ටර් ජේම්ස් පීරිස් - දේශපාලනය (4) තෙන්ඩුල්කාර් - ක්‍රිකට්
(5) ආනන්ද කුමාරස්වාමි - සංස්කෘතිය

(3)

11. මේ වර්ෂයේ 'FIFA' ලෝක පාපන්දු ශූරතා තරගාවලියේ සත්කාරක රට වූයේ,
(1) බ්‍රසීලය යි. (2) ස්පාඤ්ඤය යි. (3) මෙක්සිකෝව යි.
(4) ප්‍රංශය යි. (5) ආර්ජන්ටිනාව යි.

(1)

12. මද්‍යසාර භාවිතය හේතු සාධකයක් **නොවන්නේ,**
(1) අක්මා ආශ්‍රිත රෝග වැඩි වීමට (2) මිනී මැරුම් සංඛ්‍යාව ඉහළ යාමට
(3) සියදිවි හානිකර ගැනීමේ උත්සාහයන් වැඩි වීමට (4) අනතුරු වැඩි වීමට
(5) මලල ක්‍රීඩා කෞශල්‍යය වර්ධනය වීමට

(5)

13. නීතියේ දී රිට් ආඥාවක් යනු පුද්ගලයකුට යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට හෝ ලිඛිත උසාවි නියෝගයකින් කෙරෙන දැනුම්දීමකි. සර්ටියොරාරි (CERTIORARI) රිට් ආඥාවකින් නියෝග කෙරෙන්නේ කුමක් ද?
(1) නියම කරන ලද දිනක උසාවියේ පෙනී සිටීම ය.
(2) පොලිස් අත්අඩංගුවේ පසුවන පුද්ගලයකු නිදහස් කිරීම ය.
(3) පහළ උසාවියක අසන ලද නඩුවක වාර්තා ඉදිරිපත් කිරීම ය.
(4) පුද්ගලයකු සිරගත කිරීම ය.
(5) දඩයක් ගෙවීම ය.

(3)

14. පසුගිය අවුරුදු කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය,
(1) 8% ට වඩා වැඩි ය. (2) 6% ට වඩා වැඩි ය. (3) 4-5% අතර විය.
(4) 3% කි. (5) 3% ට වඩා අඩු ය.

(2)


15. වර්තමානයේ බෝ නොවන රෝගවලින් සිදුවන මරණ බෝ වන රෝගවලින් සිදුවන මරණවලට වඩා වැඩි ය. පහත සඳහන් ඒවායින් බෝ වන රෝගයක් වන්නේ කුමක් ද?
(1) හෘදයාබාධ (2) අධිරුධිර පීඩනය (3) පිළිකා
(4) දියවැඩියාව (5) උණ සන්නිපාතය ('ටයිෆොයිඩ්')

(5)

16. A සහ B නම් වාහක දෙක සෘජු පාරක් දිගේ එකිනෙක දෙසට පිළිවෙළින් $36kmh^{-1}$ සහ $45kmh^{-1}$ ඒකාකාර වේගවලින් ගමන් කරයි. වාහන දෙක එක ම මොහොතේ දී ගමන් අරඹා මිනිත්තු 20කට පසු එකිනෙක පසු කරයි නම්, ගමන ආරම්භ කළ මොහොතේ දී වාහන අතර දුර කොපමණ ද?
(1) 19 km (2) 21 km (3) 22 km (4) 25 km (5) 27 km


(5)

17. රූපයේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාව, දී ඇති කුමන ප්‍රාන්තරයට අයත් වේ ද?
(1) 10 - 14 (2) 15 - 19 (3) 20 - 24
(4) 25 - 29 (5) 30 - 34



(4)

18. පහත දී ඇති පතරම් අතරින් ඝනකයක් නිර්මාණය කිරීමට භාවිත කළ **නොහැකි** වන්නේ කුමන පතරම ද?



(1) (2) (3) (4) (5) (3)

19. පන්තියක සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාව සහ පිරිමි ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය 5:6ක් විය. තවත් ගැහැනු ළමයින් 4 දෙනෙකු සහ පිරිමි ළමයින් 4 දෙනෙකු පන්තියට එකතු වූ විට මෙම අනුපාතයට 6:7ක් විය. පන්තියේ මුලින් සිටි ළමයින් ගණන කීය ද?
(1) 48 (2) 44 (3) 36 (4) 33 (5) 22 (2)


- **20-21** දක්වා ප්‍රශ්න පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

එක්තරා පන්තියක ළමයි 40ක් සිටිති. එම ළමයින් අතරින් 18 දෙනෙක් ගැහැනු ළමයි වෙති. පන්තියේ පිරිමි ළමයින් අතරින් තොරතුරු තාක්ෂණය ඉගෙන ගන්නා සහ ඉගෙන නොගන්නා ළමයින් ගණන අතර අනුපාතය 7:4ක් වේ. පිරිමි ළමයින් අතරින් 4 දෙනෙක් තොරතුරු තාක්ෂණය ඉගෙන ගන්නා නමුත් චිත්‍ර ඉගෙන නොගනිති. චිත්‍ර ඉගෙන ගන්නා සියලු ම ගැහැනු ළමයි තොරතුරු තාක්ෂණය ද ඉගෙන ගනිති. තොරතුරු තාක්ෂණය සහ චිත්‍ර ඉගෙන ගන්නා පිරිමි ළමයින් ගණන එම විෂයයන් දෙක ම ඉගෙන ගන්නා ගැහැනු ළමයින් ගණන මෙන් දෙගුණයකි.

20. තොරතුරු තාක්ෂණය ඉගෙන **නොගන්නා** පිරිමි ළමුන් ගණන කීය ද?
(1) 4 (2) 5 (3) 6 (4) 7 (5) 8 (5)

21. තොරතුරු තාක්ෂණය හා චිත්‍ර යන විෂයයන් දෙක ම ඉගෙන ගන්නා ගැහැනු ළමයින් ගණන කීය ද?
(1) 3 (2) 4 (3) 5 (4) 6 (5) 8 (3)

22. පහත සඳහන් ඒවායින් සමමිතික රේඛා තුනක් පමණක් පවතින්නේ කුමන රූපයේ ද?




(1) (2) (3) (4) (5) (1

23. පිළිවෙළින් P, Q හා R නම් දුම්රිය ස්ථාන තුනකින් පිටත් වන දුම්රිය තුනකින් ගමනක් යාමට එක්තරා දුම්රිය මගියෙක් සැලසුම් කරයි. උදේ 8.00ට ආරම්භ වී සෑම පැයකට වරක් ම P දුම්රිය ස්ථානයෙන් දුම්රියක් පිටත් වී, පැය 2යි මිනිත්තු 30ක කාලයකින් Q දුම්රිය ස්ථානයට ළඟා වේ. Q දුම්රිය ස්ථානයෙන් උදේ 8.00ට ආරම්භ වී සෑම විනාඩි 20කට වරක් ම දුම්රියක් පිටත් වී R දුම්රිය ස්ථානයට පැය 1යි විනාඩි 10ක කාලයකින් ළඟා වෙයි. R දුම්රිය ස්ථානයෙන් උදේ 8.45ට ආරම්භ වී සෑම පැයකට වරක් ම දුම්රියක් පිටත් වේ. සෑම දුම්රියක් ම නියමිත කාලසටහන අනුව ගමන් කරයි නම්, මගියා දුම්රිය ස්ථානවල ගත කරන මුළු කාලය කොපමණ ද?
(1) විනාඩි 55 (2) විනාඩි 65 (3) විනාඩි 75
(4) විනාඩි 85 (5) විනාඩි 95 (2)


24. එක ම ඝනකයක පැති පෙනුම් තුනක් මෙහි පෙන්වා ඇත.
X ට ප්‍රතිවිරුද්ධ පැත්තේ ඇති සංකේතය කුමක් ද?






(1) (2) (3) (4) (5) (4)

25. 1 රූපයෙහි දී ඇති කොටස් භාවිතයෙන් සෑදිය හැකි සම්පූර්ණ හැඩය කුමක් ද?




1 රූපය



(1) (2) (3) (4) (5)


26. දී ඇති බර තුලනය කිරීම සඳහා අවශ්‍ය වන බර කොපමණ ද?

(1) 40 kg (2) 50 kg (3) 60 kg
(4) 70 kg (5) 80 kg





- **27 - 29** තෙක් ප්‍රශ්න පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

එක් අවුරුද්දක සාමාන්‍ය පෙළ විභාගයේ ගණිත ප්‍රශ්න පත්‍රයට පෙනී සිටි ශිෂ්‍යයන්, වීජ ගණිතය ප්‍රශ්නයකට සහ ජ්‍යාමිතිය ප්‍රශ්නයකට ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය පහත නිරූපණය කර ඇත. විභාගයට පෙනී සිටි ළමයින් 348 100 අතරින් 74% ක් වීජ ගණිතය ප්‍රශ්නය ද 68% ක් ජ්‍යාමිතිය ප්‍රශ්නය ද තෝරා ගත්හ. එක් ප්‍රශ්නයකට ලකුණු 10ක් වෙන්කර තිබුණි.




වීජ ගණිතය ප්‍රශ්නය සඳහා ලකුණු ව්‍යාප්තිය




ජ්‍යාමිතිය ප්‍රශ්නය සඳහා ලකුණු ව්‍යාප්තිය

27. වීජ ගණිතය ප්‍රශ්නය තෝරාගත් ශිෂ්‍යයන් ගණන කීය ද?

(1) 257 594 (2) 257 584 (3) 257 574 (4) 257 564 (5) 257 554

28. ජ්‍යාමිතිය ප්‍රශ්නය සඳහා 8-10 පරාසය තුළ ලකුණු ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව පහත කුමන ප්‍රාන්තරයට අයත් වන්නේ ද?

(1) 0-5000 (2) 5000-10000 (3) 10000-15000 (4) 15000-20000 (5) 20000-25000

29. වීජ ගණිතය ප්‍රශ්නය සඳහා 0-2 ලකුණු පරාසය තුළ ලකුණු ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ජ්‍යාමිතිය ප්‍රශ්නය 0-2 ලකුණු පරාසය තුළ ලකුණු ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අතර අනුපාතය වනුයේ,

(1) 65 : 74 (2) 65 : 68 (3) 74 : 68 (4) 68 : 65 (5) 74 : 65

- 30 සහ 31 ප්‍රශ්න, පහත දී ඇති අසම්පූර්ණ මැජික් කොටුව මත පදනම් වේ. එක් එක් පේළියේ, එක් එක් තීරයේ සහ ප්‍රධාන විකර්ණ ඔස්සේ සංඛ්‍යාවල එකතුව සමාන වේ. මැජික් කොටුවේ කිසි ම සංඛ්‍යා 2ක් එකිනෙකට සමාන නොවේ.

30. $x$ හි අගය කීය ද?

(1) 2 (2) 5 (3) 6
(4) 10 (5) 14

| | | | |
|---|---|---|---|
| | $b$ | 3 | 13 |
| | 11 | | 8 |
| 9 | 7 | $x$ | 12 |
| 4 | | 15 | |

31. $b$ හි අගය කීය ද?


(1) 2 (2) 5 (3) 6
(4) 10 (5) 14

32. මගේ පැය 12 ඔරලෝසුව සෑම පැයකට ම විනාඩි 5ක් අඩුවෙන් සටහන් වෙන අතර උදේ 8.00ට නිවැරදි වේලාව තැබුවේ නම්, එම ඔරලෝසුවේ නැවත නිවැරදි වේලාව සටහන් වීමට කොපමණ කාලයක් ගත වේ ද?
(1) දින 01 යි. (2) දින 06 යි. (3) දින 08 යි. (4) දින 10 යි. (5) දින 15 යි. (2)


33. එක්තරා රටක මහාමාර්ග රිය ධාවනය සඳහා 1980 වසරේ දී ජාතික වේග සීමාව පැයට කිලෝමීටර 60ක් ලෙස පනවන ලදි. මෙයට පසු ව, මහාමාර්ගයේ ධාවනය වන කිලෝමීටරයකට සිදු වන මරණ සංඛ්‍යාව ක්ෂණික ව පහළ බැස්සේ ය. එතැන් සිට මහාමාර්ගයේ ධාවනය කරන රථවාහනවල වේගය ක්‍රමයෙන් වැඩි කරන ලද නමුත් ධාවනය වන කිලෝමීටරයකට සිදු වන මරණ සංඛ්‍යාව පහළ වැටිණි. ඉහත ප්‍රකාශනවලින් පහත සඳහන් කුමන නිගමනයට එළැඹිය හැකි ද?
(1) 1980 න් පසු මහාමාර්ගයේ සිදු වූ මරණ සංඛ්‍යාවේ අඩු වීමට වේග සීමාව හේතුවක් නොවන බව පෙනේ.
(2) 1980 සිට මිනිසුන් අඩුවෙන් රිය ධාවනය කර ඇත.
(3) රියදුරු අධ්‍යාපන පාඨමාලා 1980 සිට වඩාත් ඵලදායී වී ඇත.
(4) මෑත වසරවල දී, රථවාහන පොලීසියේ ඵලදායිත්වය අඩු වී ඇත. (5)
(5) 1980 වේග සීමාවේ වෙනස ක්ෂණික ව මහාමාර්ගවල සිදු වූ මරණ සංඛ්‍යාවේ අඩු වීමට හේතුවක් වී නැත.

34. විශාල ඇලුමිනියම් පිරිපහදුවක් ආසන්නයේ ජීවත් වන ගම්වැසියන් පිරිසක් පිරිපහදුව නිසා ඔවුන්ගේ වගාවන් විනාශ වන බවට පැමිණිළි කළහ. එහෙත් පිරිපහදු සමාගමේ ප්‍රකාශකයා පවසන්නේ එයට පිරිපහදුව වගකිව යුතු නැති බවත් ඔවුන්ගේ පර්යේෂණවලට අනුව මෙම හානිය සිදු වන්නේ කෘමි සතුන් හා දිලීර නිසා බවත් ය. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමන ප්‍රකාශය, සත්‍ය නම්, සමාගම් ප්‍රකාශකයා එළඹි නිගමනය වඩාත් බරපතළ ලෙස දුර්වල කරයි ද?
(1) අධ්‍යයනය විසින් පිරිපහදුව මගින් වටපිටාවට එකතු කරන අපවිත්‍රකාරක ප්‍රමාණය මැනීමට ලක් කර නැත.
(2) ගම්වාසින් ඔවුන්ගේ වගාවන් රැකබලා ගන්නා ආකාරයේ වෙනසක් කර නැත.
(3) පිරිපහදුවෙන් සිදු වන වායු දූෂණය නිසා ශාක පරිසරයේ රසායනික සමතුලිතතාව වෙනස් වී හානිකර සතුන් හා දිලීර හොඳින් වැඩීමට ඉඩ සැලසී ඇත.
(4) පිරිපහදුවෙන් නොපෙනෙන, ගඳක් නැති දූෂ්‍යකාරක වාතයට මුදා හැරේ. (5)
(5) පර්යේෂණ අධ්‍යයනයේ සඳහන් කර ඇති සමහර දිලීර හා කෘමි වර්ග පසුගිය වර්ෂ 10 තුළ වරින්වර ප්‍රදේශයෙන් හමු වී ඇත.


35. දී ඇති රූපයට අනුව A ලක්ෂ්‍යයේ සිට C ලක්ෂ්‍යය දක්වාත් C ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වාත් ගමන් කිරීම වෙනුවට A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා ඍජු ව ගමන් කිරීම හේතුකොට ගෙන ආසන්න වශයෙන් කිලෝමීටර කීයක් අඩු වේ ද?
(1) 5 (2) 4 (3) 2
(4) 1 (5) 3 (1)




● **36** සිට **39** දක්වා ප්‍රශ්න, X රටෙහි ජල පරිහරණය හා ජනගහනය අතර සබඳතාවත් විවිධ අංශ අතර ජල පරිහරණය බෙදී යන ආකාරයත් දක්වෙන පහත දී ඇති ප්‍රස්තාර මත පදනම් වේ.




(බිලියන 1 = 1 000 000 000)



36. ආසන්න වශයෙන් දෛනික සාමාන්‍ය ජල පරිහරණය ලීටර බිලියන 200ක් පමණ වූ වර්ෂයේ දී ජනගහනය ආසන්න වශයෙන් මිලියනවලින් කොපමණ ද?
(1) 150 (2) 175 (3) 200 (4) 330 (5) 420

37. $X$ රටෙහි ජන සංඛ්‍යාව, ප්‍රයෝජනයට ගත් දෛනික සාමාන්‍ය ජලය ලීටර සංඛ්‍යාවට සමාන වී ඇත්තේ කුමන වර්ෂයේ දී ද?
(1) 1900 (2) 1920 (3) 1940
(4) 1950 (5) ඉහත දී ඇති කිසිවක් නොවේ.

38. 1900 සිට 1960 කාල සීමාව තුළ දී පරිහරණය කළ ජල ප්‍රතිශතය වැඩි වූයේ පහත සඳහන් කුමන කාර්ය සඳහා ද?
A - විදුලි බල උත්පාදනය B - කර්මාන්ත සඳහා භාවිතය C - පොදු ජල සැපයුම
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) A, B සහ C

39. 1970 දී ගෘහස්ථ කටයුතු සඳහා භාවිත කළ ජල ප්‍රමාණය 5%ක් නම් ගෘහස්ථ කටයුතු සඳහා භාවිත කළ ඒක පුද්ගල දෛනික සාමාන්‍ය ජල ලීටර සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණ ද?
(1) 105 (2) 50 (3) 20 (4) 10 (5) 5

- **40 - 42 දක්වා ප්‍රශ්න, පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.**

*S, T, U, X, Y* සහ *Z* යන රහස් පරීක්ෂකවරු 6 දෙනා සැකකරුවකු පසුපස යමින් නිරීක්ෂණය කිරීම මාරුවෙන් මාරුවට සිදු කරති. සැකකරුගේ පරීක්ෂාවට ඔවුන් හසු වීමේ සහ ඔහු ඔවුන්ගේ නිරීක්ෂණයෙන් ගැලවීයාමේ අවදානම අවම කිරීම සඳහා රහස් පරීක්ෂකවරු පහත සඳහන් කොන්දේසි යටතේ කටයුතු කරති.

- සෑම අවස්ථාවක දී ම රහස් පරීක්ෂකවරුන් දෙදෙනෙකු සැකකරු ගැන පරීක්ෂාවෙන් සිටිය යුතු ය.
- සැකකරු මෝටර් රථයෙන් ගමන් ගන්නා අවස්ථාවල දී, *U* හෝ *X* යන රහස් පරීක්ෂකවරුන් දෙදෙනාගෙන් එක් අයෙකු පරීක්ෂාවෙහි නිරත විය යුතු නමුත් ඔවුන් දෙදෙනාට එක් ව වැඩ කළ නොහැකි ය.
- සැකකරු දුම්රියෙන් ගමන් ගන්නා අවස්ථාවල දී, *T* හෝ *Z* යන රහස් පරීක්ෂකවරුන් දෙදෙනාගෙන් එක් අයෙකු පරීක්ෂාවෙහි නිරත විය යුතු නමුත් ඔවුන් දෙදෙනාට එක් ව වැඩ කළ නොහැකි ය.
- *Z*, සැකකරු ගැන පරීක්ෂාවෙන් සිටින එක් පරීක්ෂකවරයකු නම්, සැකකරු ගැන පරීක්ෂාවෙන් සිටින අනෙක් රහස් පරීක්ෂකවරයා විය යුත්තේ *S* ය.
- *S* සහ *X*, සැකකරු පිළිබඳ පරීක්ෂාවෙන් සිටීමේ කාර්යයේ දී එකට වැඩ කළ නොහැකි ය.

40. සැකකරුවා මෝටර් රථයෙන් ගමන් ගන්නේ නම්, සැකකරු ගැන පරීක්ෂාවෙන් සිටිය යුත්තේ පහත සඳහන් අයගෙන් කවර රහස් පරීක්ෂක යුගලය ද?
(1) *S* සහ *T* (2) *S* සහ *X* (3) *T* සහ *Y* (4) *U* සහ *X* (5) *U* සහ *Y*

41. සැකකරු දුම්රියෙන් ගමන් ගන්නේ නම්, *T*, පසුපස යමින් පරීක්ෂාවෙහි යෙදෙන රහස් පරීක්ෂකවරුන්ගෙන් එක් අයෙකු **නොවන්නේ** නම්, පසුපස යමින් පරීක්ෂාවෙහි යෙදෙන යුගලය විය යුත්තේ,
(1) *S* සහ *Y* ය. (2) *S* සහ *Z* ය. (3) *U* සහ *Z* ය. (4) *X* සහ *Y* ය. (5) *X* සහ *Z* ය.

42. සැකකරු ගැන පරීක්ෂාවෙන් සිටින එක් රහස් පරීක්ෂකවරයකු *Y* නම්, අනෙක් රහස් පරීක්ෂකවරයා විය **නොහැක්කේ** පහත සඳහන් කුමන අය ද?
(1) *S* (2) *T* (3) *U* (4) *X* (5) *Z*

- **43** සිට **45** දක්වා ප්‍රශ්නවල ගැටලුවක් සහ *X* සහ *Y* ලෙස ප්‍රකාශ දෙකක් දී ඇත. පහත සඳහන් උපදෙස්වලට අනුව ඔබගේ ප්‍රතිචාරය තෝරන්න.
  - විසඳුම සෙවීමට *X* ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් *A* තෝරන්න.
  - විසඳුම සෙවීමට *Y* ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් *B* තෝරන්න.
  - විසඳුම සෙවීමට *X* ප්‍රකාශය හා *Y* ප්‍රකාශය යන දෙකින් ඕනෑ ම එකක් ප්‍රමාණවත් නම් C තෝරන්න.
  - විසඳුම සෙවීමට *X* සහ *Y* යන ප්‍රකාශ දෙක ම අවශ්‍ය නම් *D* තෝරන්න.
  - විසඳුම සෙවීමට *X* සහ *Y* යන ප්‍රකාශවල දී ඇති තොරතුරු ප්‍රමාණවත් **නොවේ** නම් *E* තෝරන්න.

43. $P$, $Q$ සහ $R$ යන නගර සරල රේඛීය ව පිහිටා ඇත. $P$ හා $Q$ අතර $R$ පිහිටා ඇත. $P$ සිට $Q$ දක්වා දුර කිලෝමීටර 100 කි. $P$ සිට $R$ දක්වා දුර කොපමණ ද?
$X$ - $P$ සිට $Q$ දක්වා ඇති දුර $R$ සිට $Q$ දක්වා ඇති දුරට වඩා 25% ක් වැඩි ය.
$Y$ - $P$ සිට $R$ දක්වා ඇති දුර $R$ සිට $Q$ දක්වා ඇති දුරින් $\frac{1}{4}$ කි.
(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$ (3)

44. කුඩා ගමක ඡන්දය දීමට සුදුසුකම් ලත් ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව 100 000කි. සුදුසුකම් ලත් ඡන්දදායකයන්ගෙන් කීදෙනෙකු ඡන්දය දී තිබේ ද?
$X$ - සුදුසුකම් ලත් පිරිමින්ගෙන් 63% ක් ඡන්දය දුන්හ.
$Y$ - සුදුසුකම් ලත් ගැහැනුන්ගෙන් 67% ක් ඡන්දය දුන්හ.
(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$ (5)

45. සෘජුකෝණාස්‍රාකාර පිටියක දිග මීටර 40 කි. පිටියේ වර්ගඵලය සොයන්න.
$X$ - පිටියේ මායිමේ ඇති වැටක දිග මීටර 140 කි.
$Y$ - පිටියේ එක් කොනක සිට විරුද්ධ කොන දක්වා ඇති දුර මීටර 50 කි.
(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$ (3)

- **46** හා **47** ප්‍රශ්න පහත සඳහන් ඡේදය කියවන්න.

අප ජීවත් වන්නේ නවීකරණය විසින් දියුණුව තීරණය කෙරෙන යුගයකයි. නවීකරණය අපගේ ජීවිත වෙනස් කරන අපූර්ව ආකාරය පහත සඳහන් නිදසුනින් පැහැදිලි වේ. ඇමෙරිකා එක්සත් ජනපද සමාගමක් අන්ධ පුද්ගලයන් පළඳින උපැස් යුවළට සවි කළ හැකි කැමරාවක් සහිත උපකරණයක් වැඩි දියුණු කර ඇත. කැමරාව විසින් හසු කර ගන්නා දෘෂ්ටිමය සංඥා විද්‍යුත් සංඥා බවට පරිවර්තනය කොට අන්ධ පුද්ගලයාගේ මුවෙහි රඳවා ඇති ලොලිපොප් එකක් වැනි උපකරණයකට සම්ප්‍රේෂණය කෙරේ. මෙම සංඥා ඉන්පසු ව දිවෙහි ඇති ස්නායු හරහා මොළයට සම්ප්‍රේෂණය කිරීමෙන් පසු ව අර්ධ වශයෙන් ඇස් පෙනීම ලැබේ. ආශ්චර්යවත් ලෙස අන්ධ පුද්ගලයාට තම දිවෙන් පෙනීම ලැබේ.

46. ඉහත ඡේදයට අනුව, පහත සඳහන් නිගමනවලින් කුමන නිගමනයට එළැඹිය **නොහැකි ද?**
(1) අන්ධ පුද්ගලයාට උපකරණය භාවිතයෙන් තම දිවෙන් පෙනීම ලබාගත හැකි ය.
(2) අන්ධ පුද්ගලයාට පෙනීම ලබා දීම සඳහා මොළය ද ඇතුළු ව ස්නායු පද්ධතිය ප්‍රයෝජනයට ගැනේ.
(3) අන්ධ පුද්ගලයා පළඳින උපැස් යුවළේ කැමරාවක් සවි කර ඇත.
(4) කැමරාව හසු කර ගන්නා සංඥා මොළයට සම්ප්‍රේෂණය කෙරේ.
(5) මොළය වෙනුවට ලොලිපොප් එකක් වැනි උපකරණයකින් ඇස් පෙනීම ලැබේ.
(5)

47. ඡේදයට අනුව පහත සඳහන් ඒවායින් නිවැරදි වන්නේ කුමක් ද?
(1) විද්‍යුත් සංඥා දෘශ්‍යමය සංඥාවලට පරිවර්තනය කර මොළයට සම්ප්‍රේෂණය කෙරේ.
(2) වර්ණ ගන්වන ලද වීදුරුවලින් සිසිල් බවක් ලැබීමේ අමතර වාසිය ලැබේ.
(3) ඇසෙහි පෙනීම යළි ලබා දීමට ස්නායු පද්ධතිය සම්බන්ධ වේ.
(4) ප්‍රගතියක් ළඟා කර ගැනීම සඳහා පර්යේෂණ, නවීකරණය හා ආයෝජනය අතිශයින් වැදගත් වේ.
(5) මෙම උපකරණය නිර්මාණය කළ ආයතනය කැමරා නිපදවන ආයතනයකි.
(3)

- **48, 49** සහ **50** ප්‍රශ්නවල තීරණයක් හා **I, II** හා **III** වෙනුවෙන් අංක යෙදූ තොරතුරු කාණ්ඩ දී ඇත.
  - තොරතුරු කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයක් භාවිත කිරීමෙන් එම තීරණය ගත හැකි නම්, $A$ තෝරන්න.
  - තොරතුරු කාණ්ඩ I හා II භාවිත කිරීමෙන් තීරණය ගත හැකි නම්, $B$ තෝරන්න.
  - තොරතුරු කාණ්ඩ I හා III භාවිත කිරීමෙන් තීරණය ගත හැකි නම්, $C$ තෝරන්න.
  - තොරතුරු කාණ්ඩ II හා III භාවිත කිරීමෙන් තීරණය ගත හැකි නම්, $D$ තෝරන්න.
  - තොරතුරු කාණ්ඩ I, II, III භාවිත කිරීමෙන් තීරණය ගත හැකි නම්, $E$ තෝරන්න.

48. තීරණය : ඔබගේ රෝගය සඳහා ඔබ හොඳ වෛද්‍යවරයෙකු මුණගැසිය යුතු ය.
   I. ඔබ තදින් අසනීප වී ඇතත් තවමත් ඔබ හොඳ වෛද්‍යවරයෙකු මුණගැසී නැත.
   II. ඔබගේ අසනීපය වෙනුවෙන් නිතර වෛද්‍යවරුන් මාරු කිරීමෙන් වළකින්න.
   III. හොඳ වෛද්‍යවරයෙකු ඔබගේ රෝගය නිසැක ව ම සුව කරනු ඇත.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

49. තීරණය : සුරේෂ් ජෙගන්ට වඩා උස ය.
   I. නිමල් ජෙගන්ට වඩා උස ය.
   II. සුරේෂ් නවීන්ට වඩා උස ය.
   III. නවීන් නිමල්ට වඩා උස ය.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

50. තීරණය : පන්තියක සිටින සිසුන්ගෙන් සියයට අසූවක් අමතර පන්ති සඳහා සහභාගි වෙති.
   I. සිසුන්ගෙන් සියයට හැටක් ගණිතය, විද්‍යාව ඇතුළු ව විෂයයන් කිහිපයක් සඳහා අමතර පන්තිවලට සහභාගි වෙති.
   II. සිසුන්ගෙන් සියයට විස්සක් ඔවුන් විසින් ම සංවිධානය කරගත් කණ්ඩායම් පන්තිවලට සහභාගි වෙති.
   III. සිසුන්ගෙන් සියයට විස්සක් ගණිතය සඳහා පමණක් අමතර පන්තිවලට සහභාගි වෙති.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

51. එක ම ආදායම් මට්ටමක දී, ග්‍රාමීය ප්‍රදේශයක සිටින පුද්ගලයකුගේ මිල දී ගැනීමේ හැකියාව නාගරික ප්‍රදේශයක පුද්ගලයෙකුගේ මිල දී ගැනීමේ හැකියාවට වඩා වැඩි ය. පහත සඳහන් කවර නිරීක්ෂණය, ඉහත සඳහන් ප්‍රකාශය සනාථ කරයි ද?
   (1) නාගරික ජනයා ග්‍රාමීය ජනයාට වඩා ආදායම් උපයති.
   (2) ග්‍රාමීය නිවෙස්වල නාගරික නිවාසවලට වඩා පවුලේ සාමාජිකයෝ සිටිති.
   (3) නාගරික ජනයාට, ග්‍රාමීය ජනයාට වඩා ආහාර හා නිවාස කටයුතු සඳහා අධික වියදමක් දැරීමට සිදු වෙයි.
   (4) නාගරික ජනයාගේ සන්නිවේදන හැකියා සාමාන්‍යයෙන් ග්‍රාමීය ජනයාට වඩා වැඩි ය.
   (5) නාගරික ජනයා තම ආදායමෙන් විශාල කොටසක් දේපළ, වාහන යනාදිය මිල දී ගැනීමට යොදවති.

52. *A* - *J* දක්වා පියවර 8 ක් ඇති, පහත දැක්වෙන සංවාදය නිවැරදි අනුපිළිවෙළට දී නැත. සංවාදයේ නිවැරදි අනුපිළිවෙළ දක්වෙන වරණය තෝරන්න.

*A* - මගේ ප්‍රතිඵල A දෙකයි රසායන විද්‍යාවට B එකයි, ඔයාගේ කොහොම ද ?
*B* - මගේ Z-ලකුණ ඊට ටිකක් වැඩියි. 1.8304 දිස්ත්‍රික් කුසලතාව 23.
*C* - මටත් ඒකමයි කරන්න ඕනැ වුණේ. ඒ වුණාට ගියසැරේ Z ලකුණයි දිස්ත්‍රික් කුසලතාවයි බලන කොට ඔයා දෙවෙනි කැමැත්ත සඳහන් කරද්දී පරිස්සම් වෙන්න ඕනැ.
*D* - B දෙකයි, භෞතික විද්‍යාවට A මගේ Z ලකුණ 1.7903
*E* - මගේ දිස්ත්‍රික් කුසලතාව 34. මම මගේ පළමු කැමැත්ත විදියට මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ඉල්ලුම් කරන්න බලාපොරොත්තු වෙනවා.
*F* - ස්තුතියි, මම විශ්වවිද්‍යාල කිහිපයක පාඨමාලා කිහිපයකට අයදුම් කරනවා. කොහොම වෙතත් කොළඹ විශ්වවිද්‍යාලයේ පාඨමාලාවලට මම වඩාත් කැමතියි.
*G* - ආයුබෝවන්.
*H* - මගේ සුබපැතුම්.

(1) *AEDBCFGH* (2) *ADBCEFHG* (3) *ADBECFHG* (4) *ABEDCFHG* (5) *AEDBECFHG*


53. A, B, C, D හා E යන ශිෂ්‍යාවන් පස්දෙනා එක ම පන්තියේ ඉගෙන ගනිති. වාර විභාගයක දී A හා B, D ට සාමාන්‍ය ලකුණු ද C, D ට වඩා අඩු ලකුණු ද ලබා ගෙන ඇත. E, B ට වඩා වැඩි ලකුණු ලබා ගෙන ඇත. මෙම කරුණු අනුව පහත දී ඇති කුමන නිගමනය **වැරදි ද?**
   (1) A ගේ සාමාන්‍යය E ගේ සාමාන්‍යයට සමාන හෝ අඩු විය හැකි ය.
   (2) A ගේ සාමාන්‍යය B ගේ සාමාන්‍යයට සමාන හෝ අඩු විය හැකි ය.
   (3) E ගේ සාමාන්‍යය A ගේ සාමාන්‍යයට සමාන හෝ අඩු විය හැකි ය.
   (4) E ගේ සාමාන්‍යය C ගේ සාමාන්‍යයට වඩා අඩු විය හැකි ය.
   (5) B ගේ සාමාන්‍යය A ගේ සාමාන්‍යයට වඩා අඩු විය හැකි ය.

54. *A* සිට *F* දක්වා ප්‍රකාශ 6 ක් පහත දී ඇත. ප්‍රකාශ තුනක් කාලානුරූප ව පෙළගැස්විය හැකි ය. එසේ කාලානුරූප ව පෙළගැස්විය හැකි ප්‍රකාශවලට හිමි අකුරු අඩංගු පිළිතුර තෝරන්න.

*A* - මධ්‍යම පළාතේ පාසලක සිසුහු ක්‍රීඩා හා අධ්‍යාපන කටයුතු යන දෙක ම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වති.
*B* - උතුරු මැද පළාතේ සත්ත්ව හා ශාක වර්ග හැඳිනීම සඳහා අධ්‍යයන චාරිකාවක් ගුරුවරු සංවිධානය කළහ.
*C* - ගුරුවරු සහ දෙමව්පියෝ අවශ්‍ය පහසුකම් හා පුහුණු කිරීම් සපයා දෙමින් ශිෂ්‍යයන්ට උදව් කළහ.
*D* - උතුරු මැද පළාතේ සමහර ප්‍රදේශවල වල් අලි ගැවසෙති.
*E* - ක්‍රිකට් තරගයක දී මධ්‍යම පළාතේ පාසලක්, උතුරු මැද පළාතේ පාසලක් පහසුවෙන් පැරදවී ය.
*F* - අලි-මිනිස් ගැටුම් නිසා ශ්‍රී ලංකාවේ බොහෝ මරණ සිදු වෙයි.

(1) *ABD* (2) *ABF* (3) *ADF* (4) *ACE* (5) *BDF* (4)

- **55** සහ **56** ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දැක්වෙන රූප සටහන් අධ්‍යයනය කරන්න.



*A* *B* *C* *D* *E* *F* *G* *H*

55. (*a*) සිට (*e*) දක්වා දී ඇති අනුපිළිවෙළ ලැබෙන පරිදි, පින්තූර හඳුනාගැනීමට වමේ සිට දකුණට දී ඇති අකුරු පිළිවෙළට සකසන්න.

(*a*) සෞඛ්‍ය සම්පන්න බව සහතික කිරීම.
(*b*) සාමය සහතික කිරීම.
(*c*) විදුලි බලය ලැබීම සහතික කිරීම.
(*d*) 24 × 7 සේවාව
(*e*) සැමට අධ්‍යාපනය ලබා දීම.

(1) *CEHAD* (2) *CGHBD* (3) *EGHAD* (4) *ECHBD* (5) *CEHBD* (3)

56. ඉහත දක්වා ඇති රූප සටහන් මගින් නිරූපණය **නොකරන්නේ** පහත සඳහන් ඒවායින් කිනම් එක ද?

(1) සුරක්ෂිත ප්‍රවේශය
(2) කාන්තාවන් සවිබල ගැන්වීම
(3) සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම
(4) ජලය ලබා ගැනීම සාර්ථක කර ගැනීම
(5) යහපාලනය සහතික කිරීම

(5)

- **57** සහ **58** ප්‍රශ්න, පහත සඳහන් ඡේදය මත පදනම් වේ.

රජය 2011-2016 දක්වා වූ පස් අවුරුදු සංවර්ධන අවධියක දී පහත සඳහන් සහස්‍රවර්ෂ සංවර්ධන අරමුණු (MDG) ඉටු කර ගැනීමට ඉලක්ක කරයි;

(i) කුසගින්න හා උග්‍ර දිළිඳුකම පිටු දැකීම.
(ii) ද්විතීයික අධ්‍යාපනය සැමදෙනාට ම ලබා දීම.
(iii) මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන්ගේ අනුපාතය 33% සිට 12-15% දක්වා අඩු කිරීම.
(iv) ආයු අපේක්ෂාව අවුරුදු 76 සිට 80 දක්වා වැඩි කිරීම.
(v) නාගරික ප්‍රදේශවලට පිරිසිදු ජලය ලබා දීම 65% සිට 90% දක්වා වැඩි කිරීම.
(vi) වන ආවරණය 28% සිට 43% දක්වා වැඩි කිරීම.

57. පහත සඳහන් ප්‍රකාශවලින් ඉහත ඡේදයේ සවිස්තරාත්මක ව දක්වා **නැත්තේ** කුමක් ද?

(1) තෘතීය අධ්‍යාපනයට ළඟා වීමට ඇති අවස්ථාව වැඩි කිරීම ඉලක්ක කරන ලදී.
(2) පිරිසිදු ජලය ලබා ගැනීමට ඇති අවස්ථාව වැඩි කිරීම.
(3) මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන්ගේ අනුපාතය අඩු කිරීම.
(4) ආයු අපේක්ෂා කාලය ඉහළ දැමීම.
(5) වන ආවරණය වැඩි කිරීම.


(1)

58. පහත සඳහන් ප්‍රකාශවලින් ඉහත ඡේදයේ සවිස්තරාත්මක ව දක්වා ඇත්තේ කුමක් ද?

(1) බීමට ගන්නා ජලය සහ විදුලිය ලබා ගැනීමට ඇති අවස්ථාව වැඩි කිරීම.
(2) අධ්‍යාපනයට හා සෞඛ්‍යාරක්ෂණයට ඇති අවස්ථා වැඩි කිරීම.
(3) රජය 2006-2011 දක්වා පස් අවුරුදු සහස්‍රවර්ෂ සංවර්ධන අරමුණු (MDG) සාර්ථක කර ගැනීම.
(4) රජය කුසගින්න හා දැඩි දිළිඳුකම පිටු දැකීමට උත්සාහ දැරීම.
(5) වාරිමාර්ග, මහාමාර්ග, ප්‍රජා හා ජීවනෝපාය ක්‍රියාකාරකම් ඇතුළත් යටිතල පහසුකම් ලබා ගැනීමට ඇති අවස්ථා දියුණු කිරීම.

(4)

59. කිසියම් සිද්ධියකට සම්බන්ධ පින්තූර පහක් මෙහි දී ඇත. පින්තූර නිවැරදි කාලානුක්‍රමික අනුපිළිවෙළින් දී ඇති පිළිතුර තෝරන්න.



A B C D E

(1) *EACDA.* (2) *AECDB.* (3) *EADCB.* (4) *ACEDB.* (5) *EACBD.*

(2)

60. එක් ඡේදයක අනුපිළිවෙළ වෙනස් කරන ලද වාක්‍ය තුනක් ඇතුළත් කෙටි ඡේද පහක් මෙහි දී ඇත. නිවැරදි ව ගැළපූ පසු සිදුවීම් අනුපිළිවෙළින් දැක්වෙන ඡේදය තෝරන්න.

*A* - තමරා තම සෞඛ්‍ය ගැටලු විසඳා ගත්තේ ඖෂධ භාවිතයෙන් පමණි. දිනපතා ව්‍යායාමවල හා ඉක්මනින් ඇවිදීමේ යෙදෙන ලෙස වෛද්‍යවරයා තමරාට අවවාද කරයි. රෝග සුව කර ගැනීමේ ක්‍රමයක් ලෙස ඇය සංගීතයට සවන් දෙයි.

*B* - පොල්වත්තක වැඩ කරන කම්කරුවෙක් වල්පැළෑටි, පඳුරු හා අකුල් ඉවත් කිරීමෙහි යෙදෙයි. පොල්වත්තක වැඩ කරන කම්කරුවකුට දිනකට රු. 800ක වැටුපක් ගෙවනු ලබයි. කම්කරුවා ලෙලි නොගසන ලද පොල්ගෙඩි දෙකක් රැගෙන ගෙදර යයි.

*C* - හිරුඑළිය ප්‍රමාණවත් ලෙස නොලැබෙන නිසා ෂෙහාන් නුගේගොඩ තට්ටු නිවාසයට කැමති නැත. කිරුළපන, නුගේගොඩ ප්‍රදේශවලින් තට්ටු නිවාසයක් මිල දී ගැනීමට ෂෙහාන් පුවත්පත් දැන්වීම් බලයි. ෂෙහාන්ගේ පුතා ගෘහභාණ්ඩ තම නිවසට ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන නියෝජිතයකු සම්බන්ධ කර ගනී.

*D* - නායකයා බවට පත් වූ උපනායකයාට ඔහුගේ නායකත්වය හා කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාව තහවුරු කිරීමේ අභියෝගාත්මක වගකීම පැවරී තිබේ. කාසියේ වාසිය දිනීමෙන් පසු ශ්‍රී ලංකා කණ්ඩායම පන්දු රැකීම තෝරා ගත්තේ ය. පළමුවෙන් පන්දුවට පහර දුන් කණ්ඩායම ඕවර 19.4 අවසානයේ ලකුණු 254 ක් ලබා සියලු දෙනා දැවී ගියහ.

*E* - ඉරිදා පුවත්පත් මෙන් නොව දිනපතා පුවත්පත් සාමාන්‍ය රටවැසියාට මිල දී ගත හැකි මට්ටමක පවතී. රට පුරා ම ඇති සිල්ලර අලෙවිසැල්වල ප්‍රවෘත්ති පත්‍ර විකිණීමට තබා ඇත. පුවත්පත් කියවීම සෑම ශ්‍රී ලාංකික රට වැසියෙකුගේ ම වැදගත් පුරුද්දක් බවට පත් ව ඇත.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) E

(5)

*****